# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 32 දරන තානායම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 20 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

## 1981 අංක 32 දරන තානායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 52/80

### තානායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 32 දරන තානායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) තානායම් පනතේ 6 වන වගන්තියෙහි (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(275 වන අධිකාරයේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(3) 4 වන වගන්තිය යටතේ හෝ ඒ වගන්තිය ප්‍රකාර සාදන ලද හෝ සාදන ලදැයි සැලකෙන යම් රීති යටතේ යම් තානායමක් පාලනය කිරීම සම්බන්ධයෙන් නැතහොත් 5 වන වගන්තිය යටතේ එවැනි යම් තානායමක් කුලියට දීම සම්බන්ධයෙන්, පනතක් යටතේ හෝ ආඥාපනතක් යටතේ හෝ සංස්ථාගත කරන ලද යම් පුද්ගල මණ්ඩලයක් විසින් ලබා ගන්නා ලද සියලු මුදල්, ඒ මණ්ඩලය විසින් ඒ තානායම නඩත්තු කිරීම, පරිපාලනය කිරීම, පාලනය කිරීම හෝ ප්‍රචාරක දැන්වීම් පළ කිරීම සම්බන්ධයෙන් දරන ලද සියලු වියදම් ඒ මුදල්වලින් ගෙවීමෙන් පසු, ඒ තානායම පිහිටියේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ අරමුදලට බැර කළ යුතු ය.

(4) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මහ නගර සභාවක් හෝ නගර සභාවක් වෙත සතු කර තිබුණා වූ තානායමක් වන්නා වූ ද 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඒ තානායමේ පාලනය නිසි අධිකාරයකුට පවරා දෙන ලද්දා වූ සහ සතු කර දෙන ලද්දා වූ ද අවස්ථාවක ඒ තානායම සම්බන්ධයෙන් පමණක් (3) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

3. 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— *(ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)*

"6අ. යම් පනතක් හෝ ආඥාපනතක් මගින් සංස්ථාගත කරන ලද යම් පුද්ගල මණ්ඩලයක් වෙත මේ පනත යටතේ යම් තානායමක පාලනය සතු කරන ලද අවස්ථාවක, ඒ මණ්ඩලය විසින් මේ පනත යටතේ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතල හෝ ඉටු කරනු ලැබිය හැකි කාර්ය සහ කර්තව්‍ය හෝ කිසිවක් වේ ද ඒ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමට ඒ මණ්ඩලයට සියලු කාර්ය සඳහා අධිකාරය ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.". *(පනත යටතේ බලතල ආදිය ඇතැම් පුද්ගල මණ්ඩල වෙත සතු කිරීම.)*

---

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.